**2026-04-06 දින පැවැත්වුණු අමාත්‍ය මණ්ඩල රැස්වීමේදී එළඹුණු තීරණ**

**01. ගාල්ල කොටුවේ පවතින පැරණි උසාවි සංකීර්ණ ගොඩනැගිලි සංචාරක ප්‍රවර්ධන ව්‍යාපෘතියක් සඳහා යොදා ගැනීම**

එක්සත් ජාතීන්ගේ අධ්‍යාපනික, විද්‍යාත්මක හා සංස්කෘතික සංවිධානය (UNESCO) විසින් ලෝක උරුමයක් ලෙස ප්‍රකාශයට පත් කරනු ලැබ ඇති ගාල්ල කොටුව නැරඹීම සඳහා සහ තම විවේකී කාලය එහි ගත කිරීම සඳහා වසරකට ලක්ෂ 03කට අධික දෙස් විදෙස් සංචාරකයින් පිරිසක් එම ස්ථානය වෙත පැමිණෙති. එහෙත්, පරිපාලන/ආයතනික කටයුතු සඳහා යොදා ගැනෙන ගොඩනැගිලි බහුලව පවතින ගාල්ල කොටුවේ ඇතැම් මාර්ගයන් දිවා කාලයෙහිදී රථවාහන තදබදයෙන් යුක්ත වීම සහ රාත්‍රී කාලයේදී හුදෙකලා බවට පත් වීම හේතුවෙන් සංචාරකයන්ට එම ප්‍රදේශය භාවිත කිරීමේදී විවිධ බාධාවන්ට මුහුණ පෑමට සිදු වී ඇත. මහ ගාල්ල සංවර්ධන සැලැස්ම (2021-2030) යටතේ ගාලු කොටුව ලෝක උරුම සංචාරක කලාපයක් ලෙස ප්‍රකාශයට පත් කර තිබේ. එසේම, ගාල්ල කොටුවේ පවතින පුරාවිද්‍යාත්මක වටිනාකමක් සහිත ගොඩනැගිලි සංරක්ෂණය කරමින් සංචාරක භාවිතයට යොදා ගැනීම සඳහා නාගරික සංවර්ධන අධිකාරිය විසින් 'ගාල්ල පුනර්ජීවන ව්‍යාපෘතිය' ලෙස ඒකාබද්ධ සංවර්ධන ව්‍යාපෘති වැඩසටහනක් සැලසුම් කර ඇත. එම වැඩසටහන යටතේ ගාල්ල, බෙලිගහ ප්‍රදේශයේ ඉදි කර ඇති නව අධිකරණ සංකීර්ණය තුළ දැනට ගාලු කොටුවේ පවත්වාගෙන යනු ලබන මහාධිකරණය සහ මහේස්ත්‍රාත් අධිකරණය ස්ථාපිත කර, එම ගොඩනැගිලි රාජ්‍ය-පෞද්ගලික හවුල්කාරිත්ව ක්‍රමවේදය යටතේ සංචාරක ප්‍රවර්ධන ව්‍යාපෘතියක් ක්‍රියාත්මක කිරීම පිණිස නාගරික සංවර්ධන අධිකාරිය වෙත පවරා දීම සඳහා ප්‍රවාහන, මහාමාර්ග සහ නාගරික සංවර්ධන අමාත්‍යතුමා ඉදිරිපත් කළ යෝජනාව අමාත්‍ය මණ්ඩලය විසින් අනුමත කරන ලදී.

**02. ජාතික මට්ටමේ ක්‍රීඩා කුසලතා දක්වන ක්‍රීඩක ක්‍රීඩිකාවන් සඳහා රාජ්‍ය අංශයේ රැකියා අවස්ථා ලබා දීම**

ජාතික හා ජාත්‍යන්තර මට්ටමේ සුවිශේෂී හැකියාවන් සහිත හා ජයග්‍රහණ අත්කර ගත් ක්‍රීඩක ක්‍රීඩිකාවන් රැසක් මෙරටින් බිහි වී ඇතත්, ස්ථාවර රැකියා අවස්ථා නොමැතිකම හේතුවෙන් ඔවුන් අකාලයේ තම ක්‍රීඩා ජීවිතයෙන් සමුගැනීමේ ප්‍රවණතාවක් දක්නට ලැබේ. එමෙන්ම, එම තත්ත්වය අදාළ ක්‍රීඩක ක්‍රීඩිකාවන්ගේ කුසලතා රඳවාගැනීම, උසස් කාර්යසාධනයක් පවත්වා ගැනීම සහ ජාත්‍යන්තර තරගකාරීත්වය පවත්වා ගැනීම සඳහා ශ්‍රී ලංකාවට ඇති හැකියාව කෙරෙහි



163, කිරුළපන මාවත, කොළඹ 05, ශ්‍රී ලංකාව.
163, கிருலபன எவனியூ, கொழும்பு 05, இலங்கை.
163, Kirulapona Avenue, Colombo 05, Sri Lanka.
දු තො T - (+94 11) 2515759
ෆැ பெ F - (+94 11) 2514753
ඊ மி E - dg@dgi.gov.lk
www.dgi.gov.lk
www.news.lk

සෘණාත්මක බලපෑමක් එල්ල කර ඇත. ක්‍රීඩක ක්‍රීඩිකාවන් සඳහා ත්‍රිවිධ හමුදාව තුළ ලබා දිය හැකි ස්ථිර රැකියා අවස්ථාවන් සංඛ්‍යාව ද ප්‍රමාණවත් මට්ටමක නොපවතින අතර, තරුණ කටයුතු සහ ක්‍රීඩා අමාත්‍යාංශය හා ඊට අනුබද්ධ ආයතනවල පවතින ක්‍රීඩා ක්ෂේත්‍රයේ ස්ථිර රැකියා අවස්ථා සංඛ්‍යාව ද සීමිත බව හඳුනාගෙන තිබේ. එබැවින්, ජාතික ක්‍රීඩා පද්ධතිය තුළ ඉහළ දක්ෂතා දක්වන ක්‍රීඩක ක්‍රීඩිකාවන් රඳවා තබා ගැනීම සහ ජාත්‍යන්තර ජයග්‍රහණ සඳහා දිරි දීම අරමුණු කර ගනිමින් ක්‍රීඩක ක්‍රීඩිකාවන්ගේ දිගුකාලීන රැකියා සුරක්ෂිතභාවය සහතික කිරීමට හැකි වන පරිදි විනිවිද පෙනෙන, සාධාරණ හා කුසලතා මත පදනම් වූ තෝරා ගැනීමේ ක්‍රියාවලියක් තුළින් රාජ්‍ය, අර්ධ රාජ්‍ය හා ව්‍යවස්ථාපිත ආයතනවල රැකියා අවස්ථා ලබා දීමට යෝග්‍ය ප්‍රතිපත්ති රාමුවක් සකස් කිරීම පිණිස තරුණ කටයුතු සහ ක්‍රීඩා අමාත්‍යතුමා ඉදිරිපත් කළ යෝජනාව අමාත්‍ය මණ්ඩලය විසින් අනුමත කරන ලදී.

03. **ඩිජිටල් පොදු යටිතල පහසුකම් (Digital Public Infrastructures) සහ ඒ මත පදනම් වූ රජයේ වෙළෙඳපොළක් නිර්මාණය කිරීම, සංවර්ධනය කිරීම, යෙදවීම සහ නඩත්තු කිරීම (GovTech App/Service Marketplace)**

ශ්‍රී ලංකාවේ වත්මන් රාජ්‍ය ව්‍යූහය තුළ ඩිජිටල් නිෂ්පාදන සහ සේවාවන් සඳහා මධ්‍යගත හා විනිවිදභාවයකින් යුත් වෙළෙඳපොළක් නොමැති වීම හේතුවෙන් විසිරුණු සහ අකාර්යක්ෂම ප්‍රසම්පාදන ක්‍රියාවලියක් නිර්මාණය වී ඇත. එමෙන්ම, රාජ්‍ය ආයතන බොහෝවිට තාක්ෂණික විසඳුම් තනි තනිව ප්‍රසම්පාදනය කිරීම හේතුවෙන් ද විවිධාකාරයේ ගැටලු උද්ගත වී තිබේ. එයට පිළියමක් වශයෙන්, 2025-10-21 දින අමාත්‍ය මණ්ඩලය විසින් ගනු ලැබ ඇති තීරණයක් පරිදි, 'ඩිජිටල් සංවර්තන වැඩසටහන - අදියර 1' හි තුන්වන කාර්ය ප්‍රවාහය යටතේ ඩිජිටල් පොදු යටිතල පහසුකම් (Digital Public Infrastructures) සහ ඒ මත පදනම් වූ රජයේ වෙළෙඳපොළක් නිර්මාණය කිරීම, සංවර්ධනය කිරීම, යෙදවීම සහ නඩත්තු කිරීම (GovTech App/Service Marketplace) ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමට සැලසුම් කර ඇත. එමඟින්, ඩිජිටල් නිෂ්පාදන සහ සේවා තෝරා ගැනීම සඳහා කුසලතා පදනම් කර ගත් පද්ධතියක් හඳුන්වා දීම, වෙළෙඳපොළ බාධක අවම කිරීම මඟින් සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසායකයන් ඇතුළු පුළුල් සැපයුම්කරුවන් පිරිසකට රජයේ ඩිජිටල් සේවා කොන්ත්‍රාත්තු සඳහා ප්‍රවේශය ලබා දීම සහ රජයේ ආයතනවලට ගුණාත්මක සහ පිරිවැය ඵලදායී විසඳුම් එක් ස්ථානයකින් (One-stop-shop) තෝරා ගැනීමට අවස්ථාව සලසා දීම අපේක්ෂා කෙරේ. ඒ අනුව, රුපියල් මිලියන 563ක ඇස්තමේන්තුගත පිරිවැයක් යටතේ 2026-2027 කාලසීමාව තුළ අදියර තුනක් වශයෙන් එකී ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම පිණිස ඩිජිටල් ආර්ථික අමාත්‍ය වශයෙන් ගරු ජනාධිපතිතුමා ඉදිරිපත් කළ යෝජනාව අමාත්‍ය මණ්ඩලය විසින් අනුමත කරන ලදී.

04. **සීමාසහිත ශ්‍රීලංකන් ගුවන් සමාගමේ හනිවෙල් උපකාරක බල සැපයුම් ඒකක (Honeywell APUs) සඳහා අලුත්වැඩියා සහ නඩත්තු සේවා කොන්ත්‍රාත්තුව පිරිනැමීම**

ගුවන් යානාවල ප්‍රධාන එන්ජින් ක්‍රියාත්මක නොවන අවස්ථාවන්හිදී, අත්‍යවශ්‍ය බලය සහ වායව බල සැපයුම් සහාය ලබා දීම පිණිස වාණිජ ගුවන් යානා විසින් හනිවෙල් උපකාරක බල සැපයුම් ඒකක යොදා ගනී. එම උපකාරක බල සැපයුම් ඒකක ගුවන් යානා පියාපත්වලින් ඉවත් කර නඩත්තු කිරීමේ කටයුතු ආයතනය තුළම සිදු කිරීම සඳහා සීමාසහිත ශ්‍රීලංකන් ගුවන් සමාගමට හැකියාවක් නොමැති බැවින්, ඊට අදාළ අලුත්වැඩියා සහ නඩත්තු සේවා ප්‍රසම්පාදනය සඳහා ජාත්‍යන්තර සීමිත තරගකාරී ලංසු කැඳවීමේ ක්‍රමවේදය යටතේ ලංසු කැඳවා ඇත. ඒ සඳහා ලංසු 06ක් ලැබී තිබේ. එම ලංසු ඇගයීමෙන් අනතුරුව ඉහළ මට්ටමේ ස්ථාවර ප්‍රසම්පාදන කමිටුව විසින් ඉදිරිපත් කරනු ලැබ ඇති නිර්දේශය සැලකිල්ලට ගනිමින්, සාරානුකූල ප්‍රතිචාරාත්මක අවම ලංසුකරු වන HONEYWELL INTERNATIONAL INC. Aerospace වෙත, ඇමෙරිකානු ඩොලර් මිලියන 25.17ක මුදලකට එකී කොන්ත්‍රාත්තුව වසර 05ක කාලසීමාවක් සඳහා පිරිනැමීම පිණිස වරාය සහ සිවිල් ගුවන් සේවා අමාත්‍යතුමා ඉදිරිපත් කළ යෝජනාව අමාත්‍ය මණ්ඩලය විසින් අනුමත කරන ලදී.

05. **2026 වර්ෂය සඳහා වෛද්‍ය සැපයීම් අංශයට අවශ්‍ය ශල්‍ය ගෝස් දේශීය නිෂ්පාදකයින්ගෙන් ලබාගැනීම සඳහා වන ප්‍රසම්පාදනය**

සායනික කටයුතු සහ ශල්‍යකර්ම සඳහා අත්‍යවශ්‍ය පාරිභෝජ්‍ය ද්‍රව්‍යයක් වන ශල්‍ය ගෝස් වාර්ෂික අවශ්‍යතාව දේශීය සුළු පරිමාණ නිෂ්පාදකයින් වෙතින් මිල දී ගත යුතු බවට අමාත්‍ය මණ්ඩලය විසින් මීට පෙර තීරණය කරනු ලැබ ඇත. 2026 වර්ෂය සඳහා වෛද්‍ය සැපයීම් අංශයට අවශ්‍ය මුළු ශල්‍ය ගෝස් ප්‍රමාණය මීටර මිලියන 40ක් බව ඇස්තමේන්තු කර තිබේ. ලියාපදිංචි දේශීය නිෂ්පාදකයින් 282දෙනෙකුගෙන් එම ශල්‍ය ගෝස් ප්‍රමාණය මිල දී ගැනීම, ශල්‍ය ගෝස් සලාක නිර්ණය කිරීමේ කමිටුව විසින් නිර්දේශ කරනු ලැබ ඇත. ඒ අනුව, ඉහළ මට්ටමේ ස්ථාවර ප්‍රසම්පාදන කමිටුවේ නිර්දේශය මත පදනම්ව, ශල්‍ය ගෝස් මීටර මිලියන 40ක ප්‍රමාණය දේශීය නිෂ්පාදකයින් 282දෙනෙකුගෙන් එක් මීටරයක් රුපියල් 60.14ක් බැගින් වන සේ රුපියල් මිලියන 2,405.6ක මුදලකට මිල දී ගැනීම පිණිස සෞඛ්‍ය හා ජනමාධ්‍ය අමාත්‍යතුමා ඉදිරිපත් කළ යෝජනාව අමාත්‍ය මණ්ඩලය විසින් අනුමත කරන ලදී.

06. **අනුරාධපුර උතුර ජලසම්පාදන ව්‍යාපෘතියේ අදියර IIහි කහටගස්දිගිලිය, හොරොව්පතාන සහ රඹෑව යන ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස සඳහා බෙදාහැරීමේ ප්‍රධාන නළ එළීමේ සහ සේවා සම්බන්ධතා සැපයීමේ කොන්ත්‍රාත්තුව පිරිනැමීම**

ආරක්ෂිත පානීය ජලය සැපයීම සහ ජල සම්පාදන ආවරණය ඉහළ නැංවීම යන අරමුණු සහිතව, ජපාන ජාත්‍යන්තර සහයෝගිතා නියෝජිතායතනය සහ ශ්‍රී ලංකා රජය විසින් සපයනු ලබන අරමුදල් යොදා ගනිමින් අනුරාධපුර උතුර ජලසම්පාදන ව්‍යාපෘතිය - II අදියර ක්‍රියාත්මක කෙරේ. අනාරක්ෂිත භූගත ජලය මත යැපෙන අනුරාධපුර දිස්ත්‍රික්කයේ පදවිය, කැබිතිගොල්ලෑව, හොරොව්පතාන, කහටගස්දිගිලිය, රඹෑව සහ මැදවච්චිය යන ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසවල ග්‍රාම නිලධාරි වසම් 164ක් ආවරණය වන පරිදි ජල සම්පාදන පද්ධතියක් ඉදිකිරීම එමඟින් අපේක්ෂිත ය. එම ව්‍යාපෘතිය යටතේ පදවිය සහ කැබිතිගොල්ලෑව යන ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස සඳහා බෙදාහැරීමේ ප්‍රධාන නළ එළීම සහ සේවා සම්බන්ධතා සැපයීමේ කොන්ත්‍රාත්තුව ප්‍රදානය කිරීම සඳහා 2026-03-30 දින අමාත්‍ය මණ්ඩලය විසින් අනුමැතිය ලබා දී ඇත. ඊට අමතරව, කහටගස්දිගිලිය, හොරොව්පතාන සහ රඹෑව යන ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස සඳහා බෙදාහැරීමේ ප්‍රධාන නළ එළීම සහ සේවා සම්බන්ධතා සැපයීමේ ප්‍රසම්පාදනය සඳහා 2022 වර්ෂයේදී ජාතික තරගකාරී ලංසු කැඳවීමේ ප්‍රසම්පාදන ක්‍රමවේදය අනුගමනය කරන ලදුව කොන්ත්‍රාත්කරුවෙකු තෝරා ගනු ලැබ තිබේ. මිල මට්ටම්වල සිදුව ඇති වෙනස්කම්වලට ගැළපෙන පරිදි මිල ඉහළ නැංවීමේ වගන්ති අදාළ කර ගනිමින් කොන්ත්‍රාත්තුව පිරිනැමීම සඳහා ජපාන ජාත්‍යන්තර සහයෝගිතා නියෝජිතායතනය විසින් පළ කරනු ලැබ ඇති එකඟතාව හා ඉහළ මට්ටමේ ස්ථාවර ප්‍රසම්පාදන කමිටුව විසින් ලබා දී ඇති නිර්දේශය මත පදනම්ව, සාරානුකූල ප්‍රතිචාරාත්මක අවම ලංසුකරු වන M/s Maga Engineering (Pvt) Ltd. වෙත, ජපන් යෙන් මිලියන 628.10කට සහ ශ්‍රී ලංකා රුපියල් මිලියන 2,660.70ක මුදලකට එකී කොන්ත්‍රාත්තුව ප්‍රදානය කිරීම පිණිස නිවාස, ඉදිකිරීම් සහ ජල සම්පාදන අමාත්‍යතුමා ඉදිරිපත් කළ යෝජනාව අමාත්‍ය මණ්ඩලය විසින් අනුමත කරන ලදී.

07. **ජල සම්පත් මණ්ඩලයේ නියාමනය ශක්තිමත් කිරීම සඳහා 1964 අංක 29 දරන ජල සම්පත් මණ්ඩල පනත සංශෝධනය කිරීම**

ශ්‍රී ලංකාවේ ජල සම්පත සුරක්ෂිත කිරීම, සංරක්ෂණය කිරීම, භූගත ජලය මෙන්ම ඒ හේතුවෙන් ජනනය වී ඇති මතුපිට ජල ස්කන්ධයන්ගේ ගුණාත්මක හා ප්‍රමාණාත්මක සාධක වැඩිදියුණු කිරීමට අවශ්‍ය නෛතික පදනම තහවුරු කිරීම, කළමනාකරණය හා ජල දූෂණය වැළැක්වීම සඳහා 1964 අංක 29 දරන ජල සම්පත් මණ්ඩල පනත මඟින් ජල සම්පත් මණ්ඩලය ස්ථාපිත කරනු ලැබ ඇත. එම පනතේ

විධිවිධාන අනුව වාණිජ මට්ටමේ කාර්යයන් සහ ව්‍යාපෘති සඳහා ස්වභාවික ජල උල්පතක් හෝ ගැඹුරු හෝ නොගැඹුරු භූගත ජලය භාවිත කිරීමේදී අනුගමනය කළ යුතු ක්‍රියාපිළිවෙත් පිළිබඳව වරින් වර නියෝග නිකුත් කරනු ලැබ තිබේ. එහෙත්, මහජනතාවට පීඩාවන් ඇති වන අයුරින් භූගත ජලය උකහා ගැනීම සම්බන්ධව ඉදිරිපත් වන පැමිණිලි සම්බන්ධයෙන් නීතිය ක්‍රියාත්මක කිරීමේ ගැටලු පවතින බව නිරීක්ෂණය වී ඇත. එබැවින්, භූගත ජලය හා ඒ හේතුවෙන් ජනනය වී ඇති මතුපිට ජලය අවභාවිත කිරීම හා අසීමාන්තික ලෙස උකහා ගැනීම වැනි ක්‍රියාකාරකම් විධිමත්ව නියාමනය කිරීම සඳහා ජල සම්පත් මණ්ඩලයේ කාර්යභාරය පුළුල් කිරීමට හැකි වන අයුරින් 1964 අංක 29 දරන ජල සම්පත් මණ්ඩල පනත සංශෝධනය කිරීමේ අවශ්‍යතාව හඳුනාගනු ලැබ ඇත. ඒ අනුව, එකී කාර්යය සඳහා සංශෝධන පනත් කෙටුම්පතක් සකස් කරන ලෙස නීති කෙටුම්පත් සම්පාදක වෙත උපදෙස් ලබා දීම පිණිස පරිසර අමාත්‍යතුමා ඉදිරිපත් කළ යෝජනාව අමාත්‍ය මණ්ඩලය විසින් අනුමත කරන ලදී.

08. පුද්ගලයන් ලියාපදිංචි කිරීමේ කොමසාරිස් ජනරාල් තනතුර සඳහා පත් කිරීම

පුද්ගලයින් ලියාපදිංචි කිරීමේ කොමසාරිස් ජනරාල් තනතුර මේ වන විට පුරප්පාඩුව පවතින අතර, මහජන ආරක්ෂක හා පාර්ලිමේන්තු කටයුතු අමාත්‍යාංශයේ අතිරේක ලේකම්වරියක වැඩබැලීමේ පදනම මත අදාළ තනතුරේ රාජකාරීන්හි යොදවා ඇත. දෙපාර්තමේන්තුවේ පවතින දෛනික කාර්යභාරය, අත්‍යවශ්‍ය කටයුතු මෙන්ම ශ්‍රී ලංකා අනන්‍යතා ඩිජිටල් හැඳුනුම්පත නිකුත් කිරීමේ ක්‍රියාවලිය කඩිනම් කළ යුතු වීම ද සලකා එම තනතුර සඳහා නිත්‍ය පදනමින් නිලධාරියෙකු පත් කිරීම අත්‍යවශ්‍ය බව පෙනී ගොස් තිබේ. ඒ අනුව, දැනට කෑගල්ල දිස්ත්‍රික් ලේකම්/දිසාපති තනතුරේ සේවය කරනු ලබන, ශ්‍රී ලංකා පරිපාලන සේවයේ විශේෂ ශ්‍රේණියේ නිලධාරී එච්.එම්.ජේ.එම්.හේරත් මහතා පුද්ගලයින් ලියාපදිංචි කිරීමේ කොමසාරිස් ජනරාල් තනතුරට පත් කිරීම පිණිස ඩිජිටල් ආර්ථික අමාත්‍ය වශයෙන් ගරු ජනාධිපතිතුමා ඉදිරිපත් කළ යෝජනාව අමාත්‍ය මණ්ඩලය විසින් අනුමත කරන ලදී.

09. 2002 අංක 14 දරන එකතු කළ අගය මත බදු පනතට සංශෝධන

ප්‍රධාන වශයෙන් නිර්වාසික සේවා සැපයුම්කරුවන් විසින් ඉලෙක්ට්‍රොනික වේදිකා හරහා සේවා සැපයීම සඳහා එකතු කළ අගය මත බද්ද පැනවීම ක්‍රියාත්මක වන දිනය 2026-07-01 දින දක්වා කල් දැමීම ඇතුළුව 2025 සහ 2026 අයවැය මඟින් යෝජිත බදු ප්‍රතිපත්ති සංශෝධන බලාත්මක කිරීම පිණිස 2002 අංක 14 දරන එකතු කළ අගය මත බදු පනත සංශෝධනය කිරීම සඳහා මීට පෙර අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලබා දී ඇත. එම කාර්යය සඳහා නීති කෙටුම්පත් සම්පාදක විසින් සංශෝධන පනත් කෙටුම්පතක් සකස් කර ඇති අතර, ඒ සඳහා නීතිපති විසින් සිය නිෂ්කාශනය ලබා දී

තිබේ. ඒ අනුව, එකතු කළ අගය මත බදු (සංශෝධන) පනත් කෙටුම්පත රජයේ ගැසට් පත්‍රයේ පළ කිරීමටත්, ඉන් අනතුරුව අනුමැතිය සඳහා පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කිරීමටත් මුදල්, ක්‍රමසම්පාදන සහ ආර්ථික සංවර්ධන අමාත්‍ය වශයෙන් ගරු ජනාධිපතිතුමා ඉදිරිපත් කරන ලද යෝජනාව අමාත්‍ය මණ්ඩලය විසින් අනුමත කරන ලදී.

10. **2018 අංක 35 දරන මුදල් පනත සඳහා වන සංශෝධන**

2018 අංක 35 දරන මුදල් පනත යටතේ දුරකථන සන්නිවේදන කුලුනු මත අය බද්දක් පනවා ඇති අතර, ඒ අනුව දුරකථන සන්නිවේදන කුලුනු හිමි ජංගම දුරකථන ක්‍රියාකරුවන්ගෙන් වාර්ෂිකව රුපියල් 200,000/- ක් බැගින් වූ බදු මුදලක් අය කරනු ලැබේ. එහෙත්, 2026-01-01 දින හෝ ඉන් පසුව අලුතින් ඉදි කරනු ලබන දුරකථන සන්නිවේදන කුලුනු සඳහා වසර 05ක කාලයක් ඉකුත් වන තෙක් අදාළ බද්ද අය නොකිරීමට 2026 අයවැය මඟින් යෝජනා කරනු ලැබ ඇත. ඒ අනුව, අවශ්‍ය පියවර ගැනීම සඳහා වන විධිවිධාන ඇතුළත්ව 2018 අංක 35 දරන මුදල් පනත සංශෝධනය කිරීම පිණිස නීති කෙටුම්පත් සම්පාදක විසින් පනත් කෙටුම්පතක් සකස් කර ඇති අතර, ඒ සඳහා නීතිපති විසින් සිය නිෂ්කාශනය ලබා දී තිබේ. එකී පනත් කෙටුම්පත රජයේ ගැසට් පත්‍රයේ පළ කිරීමටත්, ඉන් අනතුරුව අනුමැතිය සඳහා පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කිරීමටත් මුදල්, ක්‍රමසම්පාදන සහ ආර්ථික සංවර්ධන අමාත්‍ය වශයෙන් ගරු ජනාධිපතිතුමා ඉදිරිපත් කළ යෝජනාව අමාත්‍ය මණ්ඩලය විසින් අනුමත කරන ලදී.

11. **මැදපෙරදිග යුදමය වාතාවරණය හේතුවෙන් බලපෑමට පත් ජනතාවට සහන සැලසීම**

මැදපෙරදිග කලාපය තුළ ඇති වී තිබෙන යුදමය වාතාවරණය හේතුවෙන් ඉන්ධන මිල ගණන් ඉහළ යාම මත මහජනතාවගේ එදිනෙදා ජීවිතයටත්, සමස්ත ආර්ථිකයටත් ඇති වී තිබෙන බලපෑම අවම කිරීම පිණිස පොදු ප්‍රවාහනය සඳහා භාවිත කරන 92 ඔක්ටේන් පෙට්‍රල් ලීටරයක් සඳහා රුපියල් 20/- ක් දක්වාත්, ඔටෝ ඩීසල් ලීටරයක් සඳහා රුපියල් 100/- ක් දක්වාත් වන පරිදි සහන සැලසීම පිණිස 2026-03-30 දින පැවති අමාත්‍ය මණ්ඩල රැස්වීමේදී අනුමැතිය ලබා දී ඇත. පොදුවේ ලබා දුන් එම සහනයට අමතරව, බලශක්ති මිල ඉහළ යාම හේතුවෙන් සෘජුවම බලපෑමට ලක් ව ඇති අඩු ආදායම්ලාභීන්, විදුලි පාරිභෝගිකයින්, ගොවීන්, ධීවර කර්මාන්තයේ යෙදෙන්නන් හා කුඩා තේ වගාකරුවන් වෙත පහත පරිදි සහන සැලසීම පිණිස මුදල්, ක්‍රමසම්පාදන සහ ආර්ථික සංවර්ධන අමාත්‍ය වශයෙන් ගරු ජනාධිපතිතුමා ඉදිරිපත් කළ යෝජනාව අමාත්‍ය මණ්ඩලය විසින් අනුමත කරන ලදී:

(i) අස්වැසුම වැඩසටහන යටතේ ලියාපදිංචි වී ඇති අඩු ආදායම්ලාභී කාණ්ඩයන් සඳහා පවුලක සාමාජික සංඛ්‍යාව නොසලකා 2026 අප්‍රේල් මාසය සඳහා අමතර විශේෂ දීමනාවක් ලබා දීම:

* රුපියල් 7,500/-ක මුදලක් අන්ත දිළිඳු කාණ්ඩයේ පවුලක් වෙත ලබා දීම.
* රුපියල් 5,000/-ක මුදලක් දුප්පත් කාණ්ඩයේ පවුලක් වෙත ලබා දීම.
* රුපියල් 2,500/-ක මුදලක් සංක්‍රාන්තික පවුලක් වෙත ලබා දීම.

(ii) ඉන්ධන මිල ඉහළ යාමත්, පවතින වියළි කාලගුණික තත්ත්වයත් හේතුවෙන් විදුලිය ජනනය කිරීම සඳහා තාප බලාගාර යෙදවීම වෙනුවෙන් දැරීමට සිදු වන අමතර පිරිවැය විදුලි පාරිභෝගිකයන් වෙත විතැන් කිරීම වෙනුවට, ඒකක 90ට අඩු විදුලි පාරිභෝගිකයින්හට සහනයක් ලබා දීමට හැකි වන පරිදි අදාළ අමතර පිරිවැය මාස 03ක කාලයක් සඳහා රජය විසින් දැරීම.

(iii) දැනට හෙක්ටයාරයකට රුපියල් 25,000/-ක් වශයෙන් ලබා දෙන පොහොර සහනාධාරය යල කන්නය සඳහා රුපියල් 30,000/-ක් දක්වා ඉහළ නැංවීම සහ කුඹුරුවල වගා කරනු ලබන අතිරේක භෝග සඳහා දැනට ලබා දෙන හෙක්ටයාරයකට රුපියල් 15,000/-ක් වන පොහොර සහනාධාරය යල කන්නය සඳහා රුපියල් 18,000/-ක් දක්වා ඉහළ නැංවීම.

(iv) යල කන්නය සඳහා අවශ්‍ය වන යූරියා කිලෝග්‍රෑම් 50ක පොහොර මිටියක් රුපියල් 10,200/-ක් බැගින් වූ ස්ථාවර මිලකට ගොවීන් වෙත ගොවිජන සේවා මධ්‍යස්ථාන හරහා ලබා දීමට පහසුකම් සැලසීම.

(v) ධීවර කර්මාන්තයේ යෙදෙන එක් දින ධීවර යාත්‍රාවක් වෙනුවෙන් දිනකට ඉන්ධන ලීටර 25ක් බැගින් මසකට උපරිම දින 25ක් දක්වා ඉන්ධන ලීටරයකට රුපියල් 50/- බැගින් වූ සහනාධාරයක් මාස 03ක කාලයක් සඳහා ලබා දීම.

(vi) ඉදිරි මාස 03 තුළ ධීවර කර්මාන්තයේ යෙදෙන බහුදින ධීවර යාත්‍රාවක් සඳහා රුපියල් 150,000/-ක එකවර ගෙවනු ලබන දීමනාවක් ලබා දීම.

(vii) දැනට ශ්‍රී ලංකා තේ මණ්ඩලය විසින් රුපියල් 4,000/-ක පොහොර සහනාධාරයක් ලබා දෙනු ලබන කුඩා තේ වගාකරුවන් සඳහා පොහොර කිලෝග්‍රෑම් 50ක මිටියක් සඳහා රුපියල් 5,000/-ක එක් වරක් පමණක් ගෙවනු ලබන අමතර පොහොර දීමනාවක් ලබා දීම.

12. **ශ්‍රී ලංකාවේ විද්‍යා හා තාක්ෂණ අමාත්‍යාංශය සහ තායිලන්ත රාජධානියේ ආසියානු තාක්ෂණ ආයතනය (AIT) අතර ධාරිතා වර්ධනය උදෙසා ඇති කර ගනු ලබන හවුල්කාරිත්ව වැඩසටහන පිළිබඳ අවබෝධතා ගිවිසුම**

තායිලන්තයේ ආසියානු තාක්ෂණ ආයතනය (AIT) ඉංජිනේරු, විද්‍යා, තාක්ෂණ හා කළමනාකරණ ක්ෂේත්‍රවල උසස් අධ්‍යාපන, පර්යේෂණ හා ධාරිතා වර්ධනය සඳහා කැපවූ ජාත්‍යන්තර ආයතනයක් වන අතර, විද්‍යා හා තාක්ෂණ අමාත්‍යාංශය සහ එම ආයතනය අතර අධ්‍යාපනික හා පර්යේෂණ සහයෝගිතාව ශක්තිමත් කිරීමේ අරමුණින් අවබෝධතා ගිවිසුමක් අත්සන් කිරීමට යෝජනා කරනු ලැබ ඇත. එමගින්, මෙරට විද්‍යා හා තාක්ෂණ ක්ෂේත්‍රයේ කටයුතු කරන විද්‍යාර්ථීන්, පර්යේෂණ නිලධාරීන් සහ විද්‍යාඥයින් සඳහා ආසියානු තාක්ෂණ ආයතනය (AIT) මගින් ක්‍රියාත්මක කරනු ලබන, අවබෝධතා ගිවිසුමෙහි සඳහන් අධ්‍යයන වැඩසටහන් යටතේ දර්ශනපති (M.Phil) සහ ආචාර්ය (Ph.D) උපාධි පාඨමාලා සඳහා ශිෂ්‍යත්ව පහසුකම් ලබා ගැනීමට අවස්ථාව හිමි වනු ඇත. යෝජිත අවබෝධතා ගිවිසුමේ විධිවිධාන යටතේ 2026 අගෝස්තු සිට 2031 අගෝස්තු දක්වා කාලය තුළ සුදුසුකම් ලබන නිලධාරීන් සඳහා කෘෂිකර්මය, ස්ථායී බලශක්තිය, දේශගුණික විපර්යාස සහ පරිසර තිරසරභාවය වැනි ප්‍රමුඛ ක්ෂේත්‍රවල ක්‍රමවත් හා අන්තර්ජාතික මට්ටමේ උසස් අධ්‍යාපන අවස්ථා සහ පර්යේෂණ කටයුතු සඳහා ප්‍රමුඛතාව ලබා දෙනු ඇත. ඒ අනුව, යෝජිත අවබෝධතා ගිවිසුමට එළඹීම පිණිස විද්‍යා හා තාක්ෂණ අමාත්‍යතුමා ඉදිරිපත් කළ යෝජනාව අමාත්‍ය මණ්ඩලය විසින් අනුමත කරන ලදී.

13. **දිට්වා සුළි කුණාටුව හේතුවෙන් පූර්ණ හෝ අර්ධ වශයෙන් නිවාස හානි වූ සහ නාය යාමේ අධිඅවදානම් ස්ථානවල පදිංචි වතු ආශ්‍රිත පවුල් වෙනුවෙන් නිවාස ඉදි කර දීමේ වැඩසටහන**

දිට්වා සුළි කුණාටුව හේතුවෙන් නිකුත් කරනු ලැබ ඇති චක්‍රලේඛ උපදෙස් අනුව නිවාස හානි වූ පවුල් සඳහා නිවාස ඉදිකිරීම හා ප්‍රතිසංස්කරණය කිරීම සඳහා අවශ්‍ය විධිවිධාන සලසා ඇති නමුත්, එම චක්‍රලේඛ උපදෙස් අනුව වතු ශ්‍රමිකයින්ගේ නිවාසයන්ට සිදු වී ඇති හානි සඳහා සහන සැලසීම පිළිබඳව විශේෂිත විධිවිධාන එම චක්‍රලේඛ මගින් සැලසී නොමැත. එබැවින්, වතු සමාගම් යටතේ පාලනය වන

වත්තක සේවයේ නියුතු ශ්‍රමිකයින්ගේ නිවාස දිට්වා සුළි කුණාටුව සමඟ ඇති වූ ගං වතුර, නාය යාම් හා වෙනත් ස්වභාවික ආපදාවන් හේතුවෙන් පූර්ණ හානියට පත් වීම/නායයෑමේ අධිඅවදානමට ලක් වීම/අර්ධ ලෙස හානි වී ජීව කාලය අවසන් බව තහවුරු වීම යන අවස්ථාවන්හිදී, ආරක්ෂක අමාත්‍යාංශය විසින් නිකුත් කරනු ලැබ ඇති මාර්ගෝපදේශ සහ නිවාස සැලසුම් අනුව වර්ගඅඩි 650ක නිවසක් ඉදිකිරීම සඳහා අදියරගතව රුපියල් මිලියන 05ක මුදලක් රජය විසින් ලබා දී එවැනි ශ්‍රමිකයින් සඳහා නිවාස ඉදිකිරීමේ වැඩසටහන ක්‍රියාත්මක කිරීමට සැලසුම් කර ඇත. අදාළ ශ්‍රමිකයෙකු සඳහා ඔහු පදිංචි වත්තේ සුරක්ෂිත ස්ථානයකින් පර්චස් 10ක ඉඩම් කොටසක් අදාළ වතු සමාගම විසින් ලබා දීමටත්, වතු ශ්‍රමිකයාගේ සේවය තවදුරටත් අවශ්‍ය නොවන බවට වතු සමාගම විසින් තීරණය කරනු ලැබ ඇති අවස්ථාවක ශ්‍රමිකයා සතු ඉඩමක හෝ ලබා දෙන රුපියල් මිලියන 05ක මුදලින් ඉඩමක් මිල දී ගෙන හෝ අදාළ නිවස ඉදිකිරීමටත් යෝජිත වැඩසටහන මඟින් පහසුකම් සලසා දෙනු ලබයි. ඒ අනුව, එකී වැඩසටහන ක්‍රියාත්මක කිරීම සඳහා අවශ්‍ය පියවර ගැනීම පිණිස ගරු ජනාධිපතිතුමා සහ වැවිලි සහ ප්‍රජා යටිතල පහසුකම් අමාත්‍යතුමා ඉදිරිපත් කළ ඒකාබද්ධ යෝජනාව අමාත්‍ය මණ්ඩලය විසින් අනුමත කරනා ලදී.

**********